# හා පැටියට හොඳ පාඩම



මින්දි සවේජා නවරත්න

# හා පැටියට හොඳ පාඩම

පිටු චිත්‍ර නිර්මාණය -මින්දි සවේජා නවරත්න

පරිගණක අකුරු සැකසුම - මින්දි සවේජා නවරත්න

ISBN 978-624-97103-2-0

# පිදුම

මගේ ආදරණීය අම්මා, අප්පච්චි, අක්කා,

විදුහල්පති මැණියන් සහ පංතිභාර ගුරුතුමියට පුදමි සෙනෙහසින්

# පෙර වදන

වත්මන් අධ්‍යාපනයෙන් එළදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාපෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර විදුහල්පතිනිය


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.15

එකෝමත් එක කාලෙක ලස්සන පුංචි හා ගුලක් තිබුණා. ඒ හා ගුලේ හා තාත්තයි, හා පැටියයි, හා අම්මයි සමගියෙන් ජීවත්වුණා.




දවසක් හා අම්මයි  හා තාත්තයි ගමනක් ගියා.  හා පැටියා තනියෙන් හිටියේ.




හා පැටියා පැණි වළලු කන්න ආසයි. එයා
හිතුවා තනියෙන් පැණි වළලු හදා ගෙන කන්න.




ඒත් හා අම්මයි තාත්තයි කියලා තියෙන්නේ තනියෙන් කෑම හදන්න යන්න එපා කියලා.



ඒ හැමදේම අමතක වුණ හා පැටියා තනියෙන් පැණි වළලු හදන්න පටන් ගත්තා.



ටික වෙලාවකින් කුස්සියේ ජනේලයෙන් හා
අම්මයි තාත්තයි ගෙදර එනවා හා පැටියා දැක්කා.




එතකොට තමයි හා පැටියට මතක් වුණේ හා අම්මයි තාත්තයි කියපු දේ.




හා පැටියා කලබලෙන් කලබලෙන් පැණි වළලු හදන්න පටන් ගත්තා. එක පාරටම පැණි වළලු තාච්චිය බිම වැටුණා.




හා පැටියා ගේ අතත් පිච්චුණා. හා අම්මයි තාත්තයි දොර ඇරලා කුස්සියට යනකොට දැක්කා හා පැටියා ගේ අත පිච්චිලා තියෙනවා.



ඒ මදිවට පැණි වළලු තාච්චිය බිම වැටිලා තියෙනවා.



ඊට පස්සේ හා තාත්තා හා පැටියාගේ අතට බෙහෙත් දැම්මා.



හා අම්මා හා පැටියට පැණි වළලු හදලා දුන්නා.



හා පැටියා  සතුටින් පැණී වළලු කෑවා. එදා  ඉදන් හා පැටියා, හා අම්මයි හා තාත්තයි දෙන  අවවාද අමතක නොකර  හා අම්මගෙයි  තාත්තගෙයි උදවු අරන් වැඩ කරා.



නිමි.

# ....පසුවදන....



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම  ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම  වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි  ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 15